


**සුපිරි තරු තරඟය පුරාම බහුල ලෙස එච්. ආර්. ජෝතිපාලයන් ගැයූ ගීත ගයූ ඔහු අවසනයේ ජෝතිපාලයන් විකුණාගෙන කන තත්ත්වයට පත්වීම ඔවුන් සතු අපරිණත කමේ හා ගුණ මකු කමේ කේදවාචකය අපට පසක් කොට දෙයි.**

# ජෝතිපාල, සුරේන්ද්‍ර හා ගීතයේ අයිතිය

නැසී ගිය ගායන ශිල්පී එච් ආර් ජෝතිපාලයන් විසින් දශක කිහිපයකට පෙර ගැයූ ගීත සුපිරි තරු පරපුරේ සුරේන්ද්‍ර පෙරේරාගේ හඬින් වෙළඳ පොළට නිකුත් කොට තිබීම පසුබිම් කොට ගෙන ගීතයේ අයිතිය පිළිබඳ කථිකාව යළිත් නව වටයකින් පෙරළියට පැමිණ තිබේ. එමගින් ලාංකික ගීතයේ හෙට දවස පිළිබඳව ඇතිවිය යුතු ශාස්ත්‍රීය කථිකාව යටපත්ව ගොස් ඇති අතර ඒ වෙනුවට දැනුවත් රසිකයාට වැදගත් නොවන මතවාද සතිපතා පුවත්පත් පිටු අතර දිග හැරෙමින් තිබේ.

එච්. ආර්. ජෝතිපාල යනු විටෙක "පිච්චං" ගායකයකු ලෙසත් තවත් විටෙක -මහා ගායකයකු" ලෙසත් විවිධ සමාජ කොටස් විසින් වරින් වර හඳුන්වා දී තිබුණි. මෙවන් මතවාද බොහෝ විට තම දැක්ම, දැනුම හා ගුරුකුල වාදී වීම වැනි පුද්ගල මනෝමූලයන් මතින් පැන නගින මතවාද මිස ශාස්ත්‍රීය තලයේ කෙරෙන නිවැරදි විවරණ නොවන බව මගේ හැඟීමයි.

**සැබවින්ම එච්. ආර්. ජෝතිපාල යනු ඉහළ ගායන කුසලතාවක් ප්‍රකට කළ ගායකයෙකි. එහෙත් ඔහු විසින් උරුම කොට ගෙන තිබූ එම සුවිසෙස් ගායන කුසලතාවය සිංහල සංගීත ක්ෂේත්‍රය තුළ අයාලේ ගිය බව මම කල්පනා කරමි. එය එසේ නොවන්නට ඔහු හුදු චිත්‍රපට පසුබිම් ගායන ශිල්පියෙක් ලෙස එක අන්තයකට කොටු නොවීමට ඉඩ තිබුණි.** ඔහු චිත්‍රපට පසුබිම් ගායනයට කොටු වීම කරණ කොටගෙන ඔහුගෙන් සුභාවිත සිංහල ගීතයට ඉටුවිය යුතුව තිබූ මහඟු මෙහෙවර මග හැරී ගියේය. සිංහල චිත්‍රපට අධ්‍යක්ෂවරුන් තම චිත්‍රපට පසුබිම් ගායනය සඳහා ඔහු සතුව පැවති ශක්‍යතාව හඳුනාගත් අයුරින් සමකාලීන සංගීත අධ්‍යක්ෂවරුන් හා ගීත රචකයන් ද ඔහු හා එක් වූයේ නම් සිංහල සංගීත ක්ෂේත්‍රය තුළ ඔහුගේ කාර්ය භාරය සුවිසල් එකක් වන්නට ඉඩ තිබුණි. එහෙත් එවන් ගැඹුරු සංගීත චාරිකාවකට ඔහු කැඳවාගන්නට තරම් අපගේ පූර්වගාමීන් නම්‍යශීලී නොවූවා සේම එවන් ගමනකට මුල පුරන්නට අවැසි දෘෂ්ටිමය ගැඹුරක් එච්. ආර්. ජෝතිපාලයන් සතුවද නොවුණි. මෙම පසුබිම තුළ ඔහු හින්දි තනු වෙතින් සහමුලින්ම මුදවාගෙන උසස් ගේය පද හා තනු නිර්මාණ වෙත විතැන් කරන්නට




හැකි නොවුණි.

එච්. ආර්. ජෝතිපාල සතු වූ සුවිසෙස් ගායන කුසලතාන අපතේ ගිය එකක් බව මා සඳහන් කළේ එබැවිනි. ඔහු ගයන බොහෝමයක් ගීත පද රචනා උසස් මට්ටමක නොවීමෙන් පැහැදිළි වන්නේ ඔහුගේ හඬට එමගින් සාධාරණයක් ඉටු නොවූ බව නොවේද ?
දැන් ගීතයේ අයිතිය දෙසට හැරෙමු. පුද්ගලයකු සිය බුද්ධිය හෝ පරිකල්පනය මෙහෙයවා නිමවන ලද යමක් වෙතොත් ඒ උදෙසා ඔහුට බුද්ධිමය දේපල අයිතිය පිරිනැමේ. ඒ අනුව අප සාකච්ඡාවට ලක් කරනු ගීතයේදී එහි ගේය පද රචකයාටත් සංගීත නිර්මාපකයාටත් තම නිර්මාණය වෙනුවෙන් බුද්ධිමය දේපල අයිතිය හිමිවේ. මන්ද ගීතය උදෙසා සිය පරිකල්පනය එනම් නිර්මාණාත්මක චින්තනය එක්තැන් කරන්නේ එම දෙපල බැවිනි. එබැවින් ඔවුහු නිර්මාණ කරුවන් ලෙස සැලකෙන අතර ගායකයා හෝ ගායිකාව ශිල්පියා ලෙස හඳුනා ගැනේ. ශිල්පියා තුළින් සිදුවන්නේ බුද්ධිමය දායකත්වයක් නොව ශිල්පීය දායකත්වයකි. කටහඬ බුද්ධියේ හෝ පරිකල්පනයේ නිෂ්පාදනයක් නොවේ. ඒ අනුව ගත් විට ශ්‍රී ලංකාව තුළත් ජගත් සංගීත පරිසරය තුළත් ගීතයේ අයිතිය එහි **ගේය පද රචකයාත්, සංගීත නිර්මාපකයාත් සතුව පවතී. ඒ අනුව බලන කල එච්.**



**ආර්. ජෝතිපාල මතු නොව කවර ශිල්පියෙකු හෝ ගයන ගීතයක් උදෙසා අදාල ගායකයා පද රචනයෙන් හෝ සංගීත නිර්මාණයෙන් දායක වී නොමැති විටක ඔහුට එහි අයිතිවාසකමක් හිමි නොවේ.** මන්ද ගායන ශිල්පියා ගයනුයේ පද රචකයාගේ බුද්ධිමය කල්පනාවත් සංගීත රචකයාගේ ස්වර නිර්මාණයත් වන බැවිනි.

නීතිමය තත්ත්වය එය වුවද එච්. ආර්. ජෝතිපාලයන් ගැයූ ගීත තම සිතැගි වෙනත් ශිල්පියෙකුට වාණිජ අරමුණින් අලවි කිරීම සදාචාර විරෝධී ක්‍රියාවක් බව මම කල්පනා කරමි. එය ගීත රචකයාත් සවර රචකයාත් තම අයිතිය අනිසි ලෙස පරිහරණය කිරීමකි. අදාල ගායන ශිල්පියා හෝ ශිල්පිනිය වෙනුවෙන් සැකසෙන උපහාර වැඩසටහනකදී වෙනත් ශිල්පියෙකු ලවා එම ගීත ගායනා කරවීමෙහි ගැටලුවක් නොමැති නමුත් එය වාණිජ අරමුණින් සිදුවේ නම් අප පිළිගත් සදාචාර ධර්මයන්ට පටහැනි වෙයි. ගායකයාගේ කැමැත්ත හා දැනුවත් භාවය මත මෙය සිදුකරීමේ වරදක් මම නොදකිමි. එහෙත් අපගෙන් වියෝවූ ශිල්පියෙකුගේ ගීත එසේ දූෂණය කිරීම කිසි සේත් අනුමත කළ නොහැකි ය.

**ගීතයේදී තමාට පවතින අයිතිය අන්‍යන්ටද සධාරණ විය යුතුය. ගීතයක නිර්මාණ කාර්යේදී ගීත රචකයාත් සංගීත නිර්මාණකරුවාත් ප්‍රමුඛ කාර්යයක් ඉටු කළ ද ගායකයාගේ ශිල්පීය කුසලතාවය නොසලකා කටයුතු කළ නොහැකිය. මන්ද ගීතය රසිකයා වෙත රැගෙන යාමේදී ගායකයාගේ හෝ ගායිකාවගේ හඬ පෞරුෂය ප්‍රධාන මෙහෙයක් ඉටු කරන බැවිනි.** ඒ අනුව බලන කල එච්. ආර්. ජෝතිපාලයන් විසින් ගැයූ ගී වෙනත් ගායකයකුට අලවි කිරීම සැබෑ නිර්මාණ කරුවකුට තරම් නොවන බව මගේ හැඟීමයි.

සුරේන්ද්‍ර පෙරේරාගේ පරපුර පිළිබඳව යමක් ලිවිය යුතුව තිබේ. ඔහු සුපිරි තරු පරපුරේ ගායකයෙකි. සුපිරි තරු තරඟය පුරාම බහුල ලෙස එච්. ආර්. ජෝතිපාලයන් ගැයූ ගීත ගයූ ඔහු අවසනයේ ජෝතිපාලයන් විකුණාගෙන කන තත්ත්වයට පත්වීම ඔවුන් සතු අපරිණත කමේ හා ගුණ මකු කමේ කේදවාචකය අපට පසක් කොට දෙයි. **අද බිහිවන බොහොමයක් සුපිරි තරු අරටු නැති ගස් බව මගේ හැඟීමයි. අනුන්**




